# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1843/8 - 2013 දෙසැම්බර් මස 30 වැනි සඳුදා - 2013.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

### මුදල් නීති පනත

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
මුදල් මණ්ඩලය.

2013 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි**
**2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය**

1. හැඳින්වීම

1.1 මෙම රෙගුලාසි, “2013 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි” යනුවෙන් හැඳින්විය යුතුය.

2. මූලික රෙගුලාසි සංශෝධනය

2.1 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ.

2.2 3.1 රෙගුලාසිය, එහි "මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" වශයෙන් හඳුන්වනු ලබයි)." යන වචන ආදේශ කරනු ලැබේ.

2.3 7.1 රෙගුලාසිය, එහි ''යෝජනා ක්‍රමය සඳහා තැන්පතු රක්ෂණ අරමුදල" නමින් හැඳින්වෙන අරමුදලක් පවත්වා ගත යුතුය." යන වචන වෙනුවට "යෝජනා ක්‍රමය සඳහා ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" නමින් හැඳින්වෙන අරමුදලක් පවත්වා ගත යුතුය." යන වචන ආදේශ කරනු ලැබේ.

1A - G 18785 — 80 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2.4 9.7 රෙගුලාසිය, එහි "තැන්පතු රක්ෂණ අරමුදල" යන වචන වෙනුවට සහ මෙම රෙගුලාසිවල එම වචන ඇති සෑම තැනකම "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" යන වචන ආදේශ කරනු ලැබේ.

2.5 10.5 රෙගුලාසිය, එහි "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" යන වචන වෙනුවට සහ මෙම රෙගුලාසිවල එම වචන ඇති සෑම තැනකම "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" යන වචන ආදේශ කරනු ලැබේ.

3. බලාත්මක වන දිනය

3.1 මෙම සංශෝධනයන් 2013 නොවැම්බර් මස 22 වැනි දින සිට බලාත්මක විය යුතුය.

01 - 417

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.